ගොවි කටයුතු අධ්‍යයන 3(1) 1993-1-13

# ගොවිකටයුතු අධ්‍යයනයන්හි ක්ෂේත්‍ර වැඩ පිළිබඳ විමර්ශනයක්

*නිමල් සඳරත්න විසිනි*

ශ්‍රී ලංකා ගොවිකටයුතු අධ්‍යයන සඟරාවේ ප්‍රථම කලාපයෙහි "ගොවි කටයුතු අධ්‍යයන වල ක්ෂේත්‍ර වැඩට හිමි තැන - පිළිබඳ අදහස් කිහිපයක්" (Some thoughts on the place of field work in Agrarian studies.) යන මැයින් පලවූ මහාචාර්ය බී. එච්. ෆාමර් ගේ (B.H. Farmer) ලිපිය ගොවිකටයුතු ක්ෂේත්‍ර වැඩට සහ ක්ෂේත්‍ර සමීක්ෂණයන්ට අදල වැදගත් ප්‍රශ්න කීපයක් කල්පනාවට යොමු කිරීමට ප්‍රයෝජනවත් අවස්ථාවක් සපයයි. 1960 ගණන් වල ප්‍රමාණවත්ව සිදු නොවූත්, දුර්ලභවූත් ක්ෂේත්‍ර අධ්‍යයන දැන් සුලබ වී ඇත. රටෙහි "වුවමනාවට වඩා සමීක්ෂණයට" ලක්කළ පෙදෙස් ගැන පවා දැන් අසන්නට ලැබේ. එබැවින්, ගොවිකටයුතු අධ්‍යයනයන්ට සම්බන්ධ ක්ෂේත්‍ර වල දෘෂ්ටි කෝණ, ප්‍රමුඛතා ශාස්ත්‍රීය ක්‍රම සහ වර්ග පිළිබඳ විමර්ශනයක් කිරීම ඉතාම කාලෝචිතය.

ක්ෂේත්‍ර චාරිකා, ක්ෂේත්‍ර සමීක්ෂණ සහ ක්ෂේත්‍ර ලකුණුකර ගැනීම පිළිබඳ විමසීමක් බී.එච්, ෆාමර් තම ලිපියට ඇතුළත් කර නැත. ඔහු ක්ෂේත්‍ර වැඩ යන්නෙන් හඳුන්වන්නේ[1] කිසියම් ග්‍රාමීය ජන සමූහයක් අතරට පිවිස, සම්පූර්ණ සමාජ ඒකකයක් තුළ පවත්නා විවිධ අංශ අතර ඇති අන්‍යොන්‍ය සම්බන්ධතා සහ ඒ සම්බන්ධතාවන්ට යටින් ඇති අතියම් සාධක අනාවරණය කරමින් ඒ සමාජය තේරුම් ගැනීම පිණිස පර්යේෂකයන් විසින් ප්‍රමාණවත් කාලයක් ගතකර, කරනු ලබන ගැඹුරු විෂය අධ්‍යයනයයි. "ගොවිකටයුතු සහ කෘෂිකර්ම රටාවන්හි ක්‍රමානුකූල අංශ වලට හේතු ද හෙළි කෙරෙන ක්ෂේත්‍ර - තත්ත්වයක් පිළිබඳ තියුණු අධ්‍යයනයන්, ...."[2] විෂයය අධ්‍යයන පර්යේෂණ විධි ශාස්ත්‍රයේ (Research methodology) එක් අංගයක් ලෙස සළකා ෆාමර්, එක් අතකින් කිසියම් ග්‍රාම හෝ ගැටළු පිළිබඳ ගැඹුරු අධ්‍යයනයන්ගේ හෝ විෂයය අධ්‍යයන (case studies) සහ අනික් අතින් සංඛ්‍යාත්මක දැඩි ආදර්ශ සමීක්ෂණයන්ගේ සංයෝගයක අවශ්‍යතාව පිළිගනී....[3]

මේ ලිපියේ පරමාර්ථය වනුයේ ෆාමර් විසින් ප්‍රකාශිත අදහස් කෙරෙහි අවධානය යොමු කර ඔහු විසින් ප්‍රමාණවත්ව සැලකිල්ලට ගෙන නැති ඇතැම් අංශ පිළිබඳ විස්තරයක් කිරීමය. විවිධ ක්ෂේත්‍ර වැඩ වල අන්‍යොන්‍ය සම්බන්ධය දක්වා එහි ඇතුළත් සංකල්පයන්ගේ ගුණ සහ ක්‍රියාත්මක දුෂ්කරතා හෙළි කිරීමට තැත් කෙරෙන මේ ලිපියෙහි, ශ්‍රී ලංකාවෙහි ගොවිකටයුතු අධ්‍යයනයන්හි ක්ෂේත්‍ර වැඩට සම්බන්ධ පුළුල් ප්‍රශ්ණ කීපයක් විමර්ශනයට භාජනය කරනු ලැබේ.

දෙවැනි කොටසෙහි කෙරෙන්නේ ක්ෂේත්‍ර නැරඹීමට යෑම නැතහොත් චාරිකා පිළිබඳ

1. මේ ලිපියේ මුල් කෙටුම්පත කියවා වෙහෙස මහන්සි වී වටිනා නිරීක්ෂණ ඉදිරිපත් කරමින් ඒ මුල් පිටපත දියුණු කර ගැනීමට උපකාර වූ ආචාර්ය එස්. බී. ද. සිල්වාට මගේ කෘතඥතාව පල කරමි. මුලින් සකස් කළ පිටපත පිළිබඳ ඉතා ප්‍රයෝජනවත් නිරීක්ෂණ සැපයූ ආචාර්ය කේ. එස්. ඊ. ජයතිලක, අභාවප්‍රාප්ත ඊ. එම්. එස්. රදලියගොඩ මහතාට, ආචාර්ය සේනක බණ්ඩාරනායකට සහ ආචාර්ය නිමල් ප්‍රනාන්දුට මම ස්තුතිවන්ත වෙමි.
2. Farmer (1980) පිටු 2.
3. Farmer (1990) පිටු 2

විමසීමත් තෙවැනි කොටසෙහි , එබඳු සමීක්ෂණයන්ට ෆාමර් දී ඇතැයි පෙණෙන සීමිත කාර්යය සහ වැදගත් කම, නිවැරදි කිරීමක් වශයෙන් ද ක්ෂේත්‍ර සමීක්ෂණයන්ගේ අදහස විමර්ශනයට ලක්වේ. ක්ෂේත්‍ර සමීක්ෂණ පැවැත්වීමේදී තිබෙන ඇතැම් දුෂ්කරතා සහ ප්‍රායෝගික ගැටළු ද එහි සඳහන් කරනු ලැබේ. ගැඹුරු විෂය අධ්‍යයනයන්ගේ ඇතැම් සීමාවන් කෙරෙහි සිව්වැනි කොටසින් අවධානය යොමු කෙරේ. ගොවි සමාජයන්ට බලපාන සමාජ - ආර්ථික, දේශපාලනික සහ සංස්කෘතික සාධක තේරුම් ගැනීම පිණිස විෂය - අධ්‍යයන නිසැකවම ඉතා අගනේ ය. ඒ පිළිබඳ විමර්ශනයෙන් අදහස් කෙරෙන්නේ ඒවායේ ප්‍රයෝජන බාල කිරීම නොව ගොවිකටයුතු පර්යේෂකයන්ගේ පුළුල් රාමුවක් ඇතුලත එබඳු අධ්‍යයනයන්ගේ කාර්යය හරිහැටි අවබෝධ කර ගැනීමට උපකාර වීමයි. පස්වැනි කොටසෙහි විමසීමට ලක් වන්නේ සහභාගීත්වය සහිත පර්යේෂණ ව්‍යාපෘතීන්ට නැඹුරු වූ ගැඹුරු ක්‍රියාය. එවැනි ව්‍යාපෘති ඇත්ත වශයෙන් ම ගැඹුරු ක්ෂේත්‍ර වැඩ උපයෝගී කර ගැනීම සහ පුළුල් කිරීමක් වුව ද, ෆාමර් ඒ බව සඳහන් නොකරයි. විවිධ ක්ෂේත්‍ර වැඩවල විශේෂ කාර්යයන් ද ක්ෂේත්‍ර වැඩවල ප්‍රමාණයට සහ ගුණයට බලපාන ඉතා වැදගත් සාධක කීපයක් ද සම්පිණ්ඩනය කර ඒ පිළිබඳ ඇගයීමක් අවසාන කොටසින් කෙරේ. මෙහි දී ශ්‍රී ලංකාවේ ගොවිකටයුතු අධ්‍යයනයන්ට සම්බන්ධ ක්ෂේත්‍ර වැඩට බලපාන පුළුල් කරුණු කීපයක් ද සාකච්ඡා කරුණු ලැබේ.

## 11 - ක්ෂේ.ත්‍ර චාරිකා

ගම් හෝ ග්‍රාමීය පෙදෙස් හුදෙක් නැරඹීමට යෑම හෝ එහි චාරිකා කිරීම පමණක් "ක්ෂේත්‍ර වැඩ" වශයෙන් ෆාමර් නොපිළිගනී. එහෙත් එවැනි චාරිකා ගොවිකටයුතු සංවර්ධනය පිලිබඳ සිද්ධාන්තයන්ට ඉතා වැදගත් බලපෑමක් කර ඇත. ගොවීන් තුල උද්යෝගයක් නොතිබීම සඳහා ගොවිකටයුතු වල නොදියුණු බව පිළිබඳව මුලින් කරන ලද ඇතැම් විග්‍රහයන්ට එවැනි චාරිකා පාදක වූයේ ය. ගොවීන් විසින් කෘත්‍රිම පොහොර උපරිම ලෙස යොද ගැනීම ඇතුළු දියුණු වගා ක්‍රම හා තාක්ෂණ උපයෝගී කර නොගන්නා ලද්දේ ඔවුන් ස්වකීය ජීවන ක්‍රමයෙන් තෘප්ත වී සිටි නිසා බව හරිහැටි නිශ්චය නොකර තර්ක කර තිබේ. සිද්ධාන්ත බවට ද පත් වූ එවැනි ප්‍රකාශ, ගම්වලට ගෝ ගොවීන් සමග බොහෝ විට පරිවර්තකයෙකු මගින් කථා කළ විදේශකයන් විසින් ද වර්ධනය කරනු ලැබීය. ඒ "පර්යේෂකයන්ට" ග්‍රාමීය ආර්ථිකය හා සමාජය ගැනත්, වෙළඳ පොලේ තත්ත්වයට ගොවීන්ගේ ප්‍රතිචාරයට පාදක වූ කරුණු ගැනත් දැනීමක් නොතිබීම පුදුමයට කරුණකි. පර්යේෂකයන් විසින් සාමාන්‍යයෙන් බැස ගනු ලැබූ නිගමනය, බාහිර බාධක ඉවතලමින් පුද්ගලික සාධක ආලේප, අධික වර්ධන, සහ සාරධර්ම අනුව සමාජ ලක්ෂණ විස්තර කෙරෙන සිතියම් සෛද්ධාන්තික ක්‍රම අනුගමනය කිරීමේ ප්‍රතිඵලයකි.

ඒ විධියේ ක්ෂේත්‍ර වැඩ කුසුම් නායර් ගේ "Blossoms in the Dust" නමැති ප්‍රසිද්ධ ග්‍රන්ථයෙහි[4] පිළිබිඹු වේ. පුවත්පත් කලාවේදිණියක් වූ කුසුම් නායර් (Kusum Nair) ඉන්දියාවේ නොයෙක් ප්‍රාන්තයන්හි සංචාරය කර, ගොවීන් සමග කතාබහ කර ලබා ගත් අත්දැකීම් ඒ ග්‍රන්ථයෙහි සම්පිණ්ඩනය කර තිබේ. ඇ විසින් සෑම ගොවියෙකු ගෙන්ම අසනු ලැබූ ප්‍රධාන ප්‍රශ්ණය නම් ඉඩම් නොමිළයේ බෙද දෙනු ලැබුවහොත් ඔහු ඉඩම් කොපමණ ප්‍රමාණයක් ලබා ගන්නට කැමති වන්නේ ද යන්නයි. සියල්ලන් ගෙන්ම ලැබුනු පිළිතුර

4. Nair (1961)

වී ඇත්තේ තරමක සුළු ප්‍රමාණයක් ලබා ගැනීමට කැමති බව ය. ඒ අනුව කුසුම් නායර් නිගමනය කළේ ඉන්දියානු ගොවීන් තුළ දියුණු වීමට බලාපොරොත්තුවක් නැති බවය. ඔවුන් දිළිඳුවත්ම ඔවුන්ගේ අපේක්ෂාද හීන වූයේ ය.

මේ විධියේ "ක්ෂේත්‍ර වැඩ" වල ඇති අඩුපාඩුව නම්, එහි නොගැඹුරු බව හැරුනු විට, ක්ෂේත්‍ර වැඩට යන අය කිසියම් මතයක එල්බ ගෙන එය සනාථ කර ගැනීමට බලාපොරොත්තු වීම ය. එය ඇත්ත වශයෙන් අපක්ෂපාතීව හෝ දැඩි සැලකිල්ලකින් හෝ කෙරෙන විමර්ශනයක් නොව, කිසියම් කල්පනයක් තහවුරු කිරීම හෝ පිරික්සීම අරමුණු කර ගත්තකි. එයින් කෙරෙන්නේ මිනිසුන් සහ පරිසරය පිළිබඳව පර්යේෂකයන්ට සමීප ඥාණය ඇති බව හැඟවෙන අන්දමට සිද්ධීන් සහ සාකච්ඡා වර්ග කිරීම ය.

මේ කාරණය අවධාරණය කිරීම අවශ්‍ය වන්නේ කාර්යාලයක සිට කල්පනය කරන ලද හෝ සකස් කර ගන්නා ලද අදහස් නිවැරදි කර ගැනීම පිණිස කඩිනමින් කෙරෙන නොගැඹුරු විමර්ශන උපකාර විය හැකි අවස්ථා ඇති වී තිබෙන හෙයිනි. ශීඝ්‍රයෙන් කෙරෙන ක්ෂේත්‍ර චාරිකා නිසි අවබෝධයක් ලබා ගැනීමට ප්‍රමාණවත් නොවන අතර, ඕනෑම විධියේ ක්ෂේත්‍ර චාරිකාවක් ගැඹුරු විමර්ශනයක ප්‍රාථමික අවස්ථා විය හැකිය. එවැනි චාරිකා, යථාර්ථය පිළිබඳව කිසිදු දැනීමක් ඇති නොකර ගැනීමට වඩා ඒකාන්තයෙන්ම යහපති.

### *111 ක්ෂේත්‍ර සමීක්ෂණ*

දෙවැනි වර්ගයේ ක්ෂේත්‍ර වැඩ නැතහොත් ක්ෂේත්‍ර සමීක්ෂණ පිළිබඳව ෆාමර් විසින් (Farmer) කර තිබෙන විමර්ශනයට වඩා ඉතා සවිස්තර විමර්ශනයක් කිරීම අවශ්‍ය ය. ක්ෂේත්‍ර වැඩ ඉතා දැඩි ඕනෑකමකින් කළ යුතු බව ෆාමර් අදහස් කරයි; ඒ සඳහා ක්ෂේත්‍ර තත්ත්වයන් (නියාමක සමීක්ෂණ) පිළිබඳ මූලික දැනුමක් අවශ්‍ය වන අතර (ක්ෂේත්‍රයට ප්‍රශ්ණ මාලා ගෙන යන "හමුදවක්" හෝ "තැපැල් කරුවන් පිරිසක්" නොව) හඳුරුවා ගත හැකි, සුදුසුකම් තිබෙන නිරීක්ෂණ ශක්තියෙන් යුත් ගවේශක පිරිසක් විසින් සමීක්ෂණය කළ යුතු ය. එසේ නොවුවහොත් ඔවුන් ගෙනෙනු ලබන පිළිතුර යථාර්ථය කෙරෙන් බෙහෙවින් ඈත් විය හැකිය. "සංඛ්‍යාත්මක වන දැඩි ආදර්ශන සමීක්ෂණ"[5] යන්ගෙන් ප්‍රයෝජනය ෆාමර් පිළිගන්නා නමුදු එබඳු සමීක්ෂණයන්ගේ වැදගත් කම ඔහු අතිශයින්ම පහත් කොට සළකයි.

එබඳු සමීක්ෂණ,ඒවායින් බලාපොරොත්තු විය යුතු පරිදි, යථාර්ථයෙන් පැහැදිලිවම වෙනස් වූ පිළිතුරු සපයති, යි යන ඒකාන්ත විනිශ්චයට ෆාමර් එළඹෙයි. සාර්ව සමීක්ෂණයකින් (macro - Survey) හෙළි වන තොරතුරු සාවද්‍ය යැයි යන නිගමනයට කෙනෙක් බසින්නේ කෙසේ ද? "සමහර විට ලෝකයෙහි සවාරි යමින් මෝටර් රථයකින් හෝ දුම්රියෙන් තැනින් තැනට වේගයෙන් යමින්, යමක් කියා පෑ හැකි වැසියන් සමග බෙහෙවින් කථා කිරීමෙන් " විය යුතු ය. සියලුම ගම්වල කිසිසේත් කළ නොහැකි ගැඹුරු සමීක්ෂණ තුළින් එය සැබැවින් ම කළ නොහැකි ය.

ක්ෂේත්‍ර සමීක්ෂණ පිළිබඳ එම නිරූපණය ෆාමර් විසින් ම ගෙනහැර දක්වන සමීක්ෂණ

5. Farmer (1980) පිටු 2

ක්‍රමයන් විෂය අධ්‍යයන ක්‍රමයේ සාපේක්ෂක පිළිබඳව අශෝක් රුද්‍ර ගේ (Asok Rudra) ඇගයීම සමග එකඟ නොවේ. "සමීක්ෂණ ක්‍රමයෙන් (Survey Method) කළ හැකි විශ්වාසදායක වූ ප්‍රමාණාත්මක (Quantitative) තක්සේරු, විෂය අධ්‍යයන යෙන් (Case studies) සපයා ගත නොහැකි බවත්, සමීක්ෂණ වලින් තොරව ගැටළුවේ පරිමාණය ග්‍රහණය කිරීම දුෂ්කර" බවත් රුද්‍ර පෙන්වා දෙයි.[6]

ඒ ක්ෂේත්‍ර වැඩවල විවිධ වැදගත් කමට නොයෙක් හේතූන් තිබේ. එක් ගමකින් ලැබෙන තොරතුරු රටේ සාමාන්‍ය තත්ත්වය අනිවාර්යයෙන්ම නොදැක්වේ; ෆාමර් විසින් සඳහන් කර තිබෙන රුද්‍ර ගේ වචනයෙන් කියතොත් "ඕනෑම ගැටළුවක පරිමාණය වටහා ගැනීම දුෂ්කරය"[7] - ක්‍රමිකව වරින් වර කෙරෙන ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් රටෙහි සිදුවන වෙනස්වීම් මැන ගත හැකි ය. ගොවිකටයුතු ප්‍රතිපත්තියකට සම්බන්ධ කිසියම් ප්‍රශ්ණයක් පිළිබඳව තීරණයක් ගත යුතු අවස්ථාවක දී නියමිත පරමාර්ථයක් උදෙසා නව සමීක්ෂණයක් පවත්වනවාට වඩා කරනු ලැබූ ක්ෂේත්‍ර සමීක්ෂණයකින් සපයා ගත් තොරතුරු උපයෝගී කර ගැනීමට ඉඩ ඇත.

මේ ක්ෂේත්‍ර සමීක්ෂණයන්ගේ, ජාතික වැදගත්කම තිබියදීත් හෝ ඇතැම් විට ඒවායේ ප්‍රතිඵලය නිසා හෝ ඒවා සකස් කර ගැනීම, සංවිධානය කිරීම, සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පවත්නා ප්‍රශ්ණ බැරෑරුම්ය. අනාගතයෙහි දී ඒ සමීක්ෂණ සංවිධාන කරන්නන් සඳහා තිබෙන ප්‍රශ්ණ වලින් සමහරක් යටත් පිරිසෙයින් මඟ පෙන්වීමක් වශයෙන් මෙහිලා සඳහන් කිරීම වටී.

එක් පරමාර්ථයක් ඒ සමීක්ෂණයන්ට නොමැති හෙයින් ද, ජාතික මට්ටමේ තොරතුරු රැස් කිරීමට ඒ සමීක්ෂණ වැදගත් වන බැවින් ද, ප්‍රශ්ණ මාලාව අධික ලෙස බර කිරීම බෙහෙවින් සිදු වන්නාවූත්, ප්‍රකට වූත් වරදකි. එබඳු සමීක්ෂණ සංවිධානය කරනු ලබන අවස්ථාවල දී සහභාගී වන්නන් පුන පුනා කියන්නකි; කොපමණ දැයි දැන ප්‍රයෝජනවත් වෙයි.................. පිළිබඳව තොරතුරු කිසිවක් ලබා ගැනීම බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි..... ගැන තොරතුරු ලැබුනහොත්, එවිට අපට සම්බන්ධ කළ හැකියි........ රජය දැන් දැන ගැනීමට ඉතා ඕනෑකමින් සිටින්නේ .... ආදියයි. එබඳු සමීක්ෂණ සංවිධානය කිරීම පිණිස බොහෝවිට කොමිටි පත් කරගනු ලැබේ; ඒ මගින් එකතු කර ගනු ලබන දත්ත පිළිබඳව අලුත් අදහසක් පැවසීම ඒ කොමිටි වල සෑම සාමාජිකයෙකු විසින් ම කළ යුතු වන අතරම, එක්කෙනෙක් අනිකකුට ඉහළින් නොයායුතු ය. එහි ප්‍රතිඵලය වන්නේ දීර්ඝ වූත් විධාවට පත් කරන්නා වූත් ප්‍රශ්ණ මාලාවක් ක්ෂේත්‍ර වැඩෙහි යෙදෙන්නා මත පැවසීමය; එය සම්මුඛ පරීක්ෂකයාත් ප්‍රතිචාරකයාත් වෙහෙසයිඃ එයින් සිදු වන්නේ එක් රැස් කරන දත්තයන්ගේ සගුණත්වය හීන වීමයි.

ක්ෂේත්‍ර තොරතුරු නිසි ලෙස එක් රැස් කිරීම පිණිස මනාව සකස් කළ ලේඛණ සහතිකයක් නොවන බව ක්ෂේත්‍ර වැඩ කර ඇති අය දන්නා කරුණකි. නියාමක සමීක්ෂණ යන්හි ප්‍රශ්ණ මාලා පූර්ව පරීක්ෂණයකට භාජනය කිරීමෙන් ක්ෂේත්‍ර තත්ත්වයන් තේරුම් ගැනීමට අවස්ථාවක් සැළසෙන අතර, විමර්ශකයන්ට ප්‍රතිචාරකයන් සමග මුහුණ පාන්නට සිදු විය හැකි ගැටළු හමුවෙයි. නියාමක සමීක්ෂණයන්ගේ සාර්ථකත්වයත්

6. Farmer (1980) පිටු 2.
7. Farmer (1980) පිටු 2

වැදගත් කමත් හීන කරන ඇතැම් ගැටළු ප්‍රායෝගික අවස්ථාවෙහි ඇත. විවිධාකාර ක්ෂේත්‍ර තත්ත්වයන් පවතින තැන්වල සමීක්ෂණයක දී හමුවිය හැකි නානාවිධ ගැටළු පිළිබිඹු කෙරෙන එවැනි නියාමක සමීක්ෂණ ප්‍රමාණවත් සංඛ්‍යාවක් බොහෝ විට පැවත්විය නොහැකි ය. ඒ හැර නියාමක සමීක්ෂණයත් ප්‍රධාන සමීක්ෂණයත් අතර පවත්නා කාලය බොහෝ විට ප්‍රමාණවත් නොවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් නියාමක සමීක්ෂණයෙන් හඟවන සංශෝධන සියල්ලම ඇතුළත් නොවෙනු ඇත.

තොරතුරු රැස් කිරීම සඳහා තිබෙන ක්ෂේත්‍ර තත්ත්වයන් මේසයක් ළඟ ඉඳගෙන හිතන අන්දමට වඩා බෙහෙවින් වෙනස් විය හැකි බැව් මැනෙවින් දන්නා නමුදු ක්ෂේත්‍ර වැඩ පිළිබඳ ප්‍රමාණවත් පළපුරුද්දක් නැති අයට ක්ෂේත්‍ර තොරතුරු එකතු කිරීමේ දී ඇති පැටලිලි සිරිතක් වශයෙන් අවබෝධ කර ගැනීමට ඉඩ නැත. අවාසනාවකට ක්ෂේත්‍ර සමීක්ෂකයන්ගේ විෂය සීමාවත්, ඊට ඇතුලත් විය යුතු දේත් බොහෝ විට නිශ්චය කරනු ලබන්නේ ක්ෂේත්‍ර විමර්ශකයන් වශයෙන් පළපුරුද්දක් ලබා නැති අය විසින් නොවේ. එයින් සමීක්ෂණ සඳහා යන වියදම අනවශ්‍ය ලෙස අධික වී තොරතුරු වල ගුණාත්මක භාවය ද අඩු වෙයි.

ක්ෂේත්‍ර සමීක්ෂණ සැලසුම් කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් ප්‍රධාන කොට හදරනු ලබන්නේ සමීක්ෂණයන්හි යෙදීමෙනි. ඒ සඳහා සෛද්ධාන්තික දැනුම වැදගත් වනුයේ මඳ වශයෙන් පමණි. ඉතාම හොඳ විශ්ව විද්‍යාලයන්හි පවත්වන උසස් සංඛ්‍යාන පාඨමාලා වල ඒ විෂය උගන්වනු ලබන්නේ ඉතාමත් කලාතුරකිනි. එම විෂය පාඨමාලාවට ඇතුළත් වූවත් එය හුදෙක් හැඳින්වීමක් පමණක් වනු ඇත. ක්ෂේත්‍ර විමර්ශන පිළිබඳව තිබෙන සීමිත පොතපත ද ශ්‍රී ලංකාවේ පරිසරයට වඩා බෙහෙවින් වෙනස් වූ පරිසරයක් ඇති ගොවි සමාජයන්ට සම්බන්ධය. බටහිර රටවල පවතින තත්ත්වයන්ට වඩා වෙනස් වූ තත්ත්වයන් ආසියාතික රටවල පවතින නිසා හොඳ සමීක්ෂකයෙකු විසින් කළ යුතු වන්නේ (බටහිර ලේඛකයන්ගේ) පොතපතින් ලැබෙන උපදෙස් වලට පටහැනි වූ දෙයකි, යි භාති (Bhati) පෙන්වා දී ඇත.[8] යෝග්‍ය පරිදි සකස් කර ගැනීම, නවීකරණය, සහ කුශලතාව, ක්ෂේත්‍ර වර්ගයේ අධ්‍යයනයන් සහ ගැඹුරු අධ්‍යයනයන් කිරීම පිණිස ඉතාමත්ම අවශ්‍යය. ඒ හැරුණු විට ක්ෂේත්‍රයෙහි ලබා ගත්තා පළපුරුද්ද, මානසික ආකල්ප, සහ ලැදියා, හොඳ ක්ෂේත්‍ර සමීක්ෂකයෙකුගේ කාර්ය නිපුණත්වයත්,ගුණාත්මක බවත් නිශ්චය කිරීමේ දී වැදගත් තැනක් ගනු ලැබේ. අවාසනාවකට, ක්ෂේත්‍ර තොරතුරු එක්රැස් කිරීමේ කාර්යයෙහි නිපුනත්වය සෑම කෙනෙකුටම ලබාගත හැකි නොවේ.

ක්ෂේත්‍ර සමීක්ෂණ සැලසුම් කරන්නන් සහ ඒවායේ පාලකයන් සම්බන්ධයෙන් මෙහි සඳහන් කර ඇති කරුණු ක්ෂේත්‍ර අධ්‍යයනයන්හි ඉතාම වැදගත් කාර්යයක් ඉටු කරන සමීක්ෂණයන් තෝරා ගැනීමේදීත් ඉතා වැදගත් වේ.

සමීක්ෂකයන් තෝරා ගැනීමේ දී ඔවුන්ගේ භාෂා ප්‍රවීණත්වය, ගොවීන්ට සහ ගොවිකමට දක්වන ආකල්පය, සහ ඔවුන්ගේ ප්‍රකෘති ගති සැලකිල්ලට ගැනීම ඉතාමත්ම අවශ්‍ය ය. ප්‍රමාණවත් දීමනාවක් ගෙවීම සහ ක්ෂේත්‍රයෙහි පහසුකම් සලසා දීමද, ඔවුන්ගේ කටයුතු නිරතුරුව අධීක්ෂණය කිරීම හා ක්ෂේත්‍ර ගැටළු ක්ෂණිකව නිරාකරණය කිරීම ද

8. Bhati (1975)

ක්ෂේත්‍ර සමීක්ෂණයක් සාර්ථක කර ගැනීමෙහි ලා වැදගත් අංග වේ. ඔවුන්ගේ අවංක භාවයේ යම් අඩුවක් තිබුනහොත්, ඒ සම්බන්ධව මැනෙවින් ක්‍රියා කිරීම අවශ්‍ය වන අතර, අවංක කම ප්‍රකට කළ සමීක්ෂකයන් පමණක් ක්ෂේත්‍ර සමීක්ෂකයන් වශයෙන් රඳවා ගත යුතු වේ.

පූර්වෝක්ත ඡේදයෙන් අදහස් කෙරෙන්නේ ක්ෂේත්‍ර සමීක්ෂණ නිසි ලෙස කළයුතු නම් පුහුණු, පළපුරුදු නිපුණ අයගෙන් සමන්විත ක්ෂේත්‍ර සමීක්ෂණ ඒකක, ක්ෂේත්‍ර සමීක්ෂණ පවත්වන ආයතන විසින් වර්ධනය කර ගත යුතු බව ය. ඒ ඒ කාර්යයට උචිත පරිදි සමීක්ෂකයන් තෝරා ගැනීමෙන්, සමහර විට සංඛ්‍යා ලේඛනයක දී හිස් ගණන් කරන්නාක් වැනි සංඛ්‍යාන කාර්යයේ ඉතාමත්ම මූලික අංගයක් වැනි දෙයක් හැර, ප්‍රයෝජනවත් ප්‍රතිඵල ගෙන දෙතියි බලාපොරොත්තු විය හැකි නොවේ.

ෆාමර් සහ අනිකුත් අය එවැනි සමීක්ෂණයන් ගේ ප්‍රබලත්වය බෙහෙවින් සැක කරන්නේ ඇතැම් විට සාර්ථක ක්ෂේත්‍ර සමීක්ෂණයක් සඳහා පූර්ව අවශ්‍යතාවන් බොහෝමයක් සම්පූර්ණ කර ගැනීමට තිබෙන දුෂ්කරතා නිසාවිය යුතු යි. එසේ නම්, ක්ෂේත්‍රයෙහි එකතු කර ගනු ලබන දත්තයන්ගේ නිරවද්‍යතාවය හා අනුගමනය කරන ක්‍රම - විධි අතර ඇති වෙනස පැහැදිලි කර ගත යුතු ය. එකතු කරන තොරතුරු වල නිරවද්‍යතාව, අකාර්යක්ෂම කළමනාකරණය නිසා ඇති විය හැකි ය. මෙම කරුණ ඕනෑම විධියේ ක්ෂේත්‍ර වැඩකට අදාල වන්නකි. එයට හේතුව, සෑම වර්ගයකම ක්ෂේත්‍ර වැඩ සඳහා කටයුතු කරන්නන් තුළ කුශලතා, අවංකකම සහ කැපවීම ඉතා දැඩිව තිබීමේ අවශ්‍යතාවයි. එක් සමීක්ෂණ වර්ගයකින් පමණක් නිවැරදි දත්ත ලබා ගත හැකි වීම කෙරෙහි නිසග හේතුවක් නොමැත.

ෆාමර් (Farmer) ගේ දෘෂ්ටියත්, මගේ දෘෂ්ටියත් අතර ප්‍රධාන වෙනස වනුයේ ඔහු එබඳු සමීක්ෂන ගණීවයට ලක් කර සමාජ -ආර්ථික තත්ත්වයන් තේරුම් ගැනීමට එයින් ලැබෙන ප්‍රයෝජන ඉතාමත් අල්ප බව විශ්වාස කිරීමයි. එහෙත් මගේ අදහස වන්නේ ගොවිකටයුතු වලට සම්බන්ධ ප්‍රශ්ණයන්ගේ පැති බොහෝමයක් තක්සේරු කිරීමටත් ඇගයීමටත් ක්ෂේත්‍ර පරීක්ෂණ වලින් පමණක් අවශ්‍ය වන දත්ත සපයා ගත හැකි බැවින්, සමාජීය විද්‍යාඥයන්ට තිබෙන ඉතාමත් හොඳින් දියුණු කර ගත්, විද්‍යාත්මක උපකරණ කිපයකින් සමන්විත ක්ෂේත්‍ර සමීක්ෂණ විධි දියුණු කරගෙන, ගොවි කටයුතු ප්‍රශ්න පිළිබඳ ප්‍රයෝජනවත් අවබෝධයක් ලබා ගත හැකිවන අන්දමට ඒවා දේශීය තත්ත්වයන්ට ගැලපෙන පරිදි හැඩගසා ගත යුතු බව ය.

## *IV ගැඹුරු ක්ෂේත්‍ර - අධ්‍යයන නැතහොත් විෂය අධ්‍යයන (Case Studies)*

ගොවි සමාජ වල සමාජ වයසීාව තේරුම් ගැනීම පිණිස අත්‍යවශ්‍ය අවබෝධය ගැඹුරු ක්ෂේත්‍ර - සමීක්ෂණ වලින් ලැබේ. එවැනි අධ්‍යයනයන්ගේ ප්‍රයෝජනවත් බව ෆාමර් විසින් ඔහුගේ ලිපියක තරමක් සවිස්තරව සාකච්ඡා කර තිබේ.

ගොවි සමාජයන්ට බලපාන සමාජීය සහ සංස්කෘතික සාධක තේරුම් ගැනීමට අවශ්‍ය වන ගොවිකටයුතු අධ්‍යයනයන්ගේ අංශ බොහෝමයක් තිබේ. සමාජ සංස්කෘතික පරිසරය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගත හැකි වන්නේ ප්‍රමාණවත් කාලයක් ගමෙහි

ගත කිරීමෙන් හෝ ගමට විටින් විට යාමෙන් හෝ පර්යේෂකයන් හා ගැමියන් අතර, හොඳ සුහදතාවයක් වර්ධනය කර ගැනීමෙන් පමණි. මෙය විශේෂයෙන් ම වැදගත් වන්නේ ගැමි සමාජ පිටතින් පැමිණෙන්නන් සැක කරන නිසා ඇතැම් තොරතුරු අනාවරණය කිරීමට ඔවුන් පසුබට වන හෙයිනි. එමනිසා, එබඳු ගැඹුරු විෂය - අධ්‍යයනයන්ගේ සීමිත භාවය මා කර ඇති විමර්ශනයෙන් එම අධ්‍යයනයන්ගේ වැදගත් කම මා අගය නොකරති'යි නොසිතිය යුතු ය.

එක් විශේෂ ක්ෂේත්‍රයක් පිළිබඳ ගැඹුරු විෂය - අධ්‍යයනයක නියැලුණු විද්‍යාර්ථීන් වෙනත් ක්ෂේත්‍රයන්හි පවතින වෙනස් තත්ත්වයන් බොහෝවිට නොසළකා හරිතියි යන අදහස ප්‍රථමයෙන් මා තුළ පවතී. ඔවුන්ගේ ක්ෂේත්‍ර කටයුතුවල "ගැඹුරු බව" කොතරම් දුරට ඔවුන්ට ඒත්තු ගොස් තිබේ දැයි කිවහොත් ඔවුන් සොයා ගන්නා තොරතුරු පිළිබඳ ප්‍රචාරක දූතයන් බවට පත් වී පරම සත්‍ය ඔවුන් විසින් පමණක් සොයා ගන්නා ලදැයි අන්‍යයන්ට ඒත්තු ගැන්වීමට ඔවුහු තැත් කරති.එබඳු විද්‍යාර්ථීන් එක් විශේෂ ගමක් සම්බන්ධයෙන් ලබාගත් අත්දැකීම ඔවුන්ගේ මනස කොතරම් දුරට තදින් වැළඳගෙන ඇත්තේදැයි කිවහොත් ඒ අත්දැකීම සියලුම ගම් සම්බන්ධයෙන් සාධාරණ යයි ඔවුහු නිගමනය කරති. ඔවුන් වැටී ඇති තත්වය ෆාමර් විසින් සඳහන් කර තිබෙන පරිදි අර්ථශාස්ත්‍රඥයෙකු කථා බහක දී "සියලු රටවල් එක හා සමාන යැ"යි කීවාක් වැනි ය.[9] ඔවුන් සම වන්නේ එක් දිස්ත්‍රික්කයක කටයුතු කර වෙනත් දිස්ත්‍රික්කයන්හි වෙනස් තත්ත්වයන් තිබෙන බව අවබෝධ කර ගත නොහැකි පරිපාලන නිලධාරීන්ට ය.

ගැඹුරු විෂය - අධ්‍යයන යන්ගෙන් මතුවන ඒ දුර්වල කම ශ්‍රී ලංකාවෙහි විශේෂයෙන්ම කැපී පෙනෙන්නකි. ඉන්දියාව වැනි විශාලම රටක විවිධත්වය පිළිගනු ලබන අතර, ශ්‍රී ලංකාව කුඩා රටක් නිසා, එක් ගමක් හෝ ගම් කීපයක් පිළිබඳව දැනුවත් වූ විට ඒ දැනුම සාධාරණීකරණය සඳහා ප්‍රමාණවත් යයි, විශ්වාස කිරීමට පර්යේෂකයෝ පෙළඹෙති[10] ඇත්ත වශයෙන්, ශ්‍රී ලංකාව කුඩා රටක් වුවත් එහි ඉඩම් භුක්ති ක්‍රම, සමාජ චර්යා රටා, සමාජ සංස්කෘතික පෙදෙස් සහ කෘෂි - දේශගුණික (agro climatic zones) කලාප විවිධ ය. එක් ප්‍රදේශයක් තුළ පවා එක් ගමක් සෙසු ගම්වලට වඩා සැළකිය යුතු ප්‍රමාණයකින් වෙනස් විය යුතු ය. රටේ ඒ වෙනස් කම් සමහරක් පෙන්නුම් කිරීමට උපකාර වන අදහස් සහ වර්ගීකරණ කීපයක් මතුකිරීමට තැත් කර ඇත්තේ අධ්‍යයන ස්වල්පයක් පමණි[11].

විෂය අධ්‍යයන පර්යේෂකයන් ප්‍රශ්ණ මාලා උපයෝගී කර නොගෙන ඇතැම්විට දත්ත සමූහ එකතු කිරීමක් ද නොකර, සැකැස්මක් නොමැති ක්‍රමයකට සිය ක්ෂේත්‍ර - අධ්‍යයන කිරීමට නැඹුරු වී ඇත. ක්ෂේත්‍ර සමීක්ෂණ ක්‍රම විධි මගින් සැබෑ තොරතුරු නොලැබෙන බවත්, ලේඛන උපයෝගී කර ගෙන තොරතුරු එකතු කරන විට තොරතුරු යටපත් කිරිම හෝ නිවැරදි තොරතුරු සැපයෙන බවත්, බොහෝ විට තර්ක කරනු ලැබේ. ඒ වෙනුවට ඒ ක්ෂේත්‍ර පර්යේක්‍ෂකයන් විශ්වාසය තබන්නේ සාකච්ඡා වලින් ලබාගත් විශාල සටහන්, ඉතා උනන්දුවක් දක්වන කණ්ඩායම්, ඉතා හොඳින් තොරතුරු දන්නා අය සහ ග්‍රාමීය නායකයන් ආදින් සමග කෙරෙන සම්මුඛ සාකච්ඡා සහ සහභාගී වන්නාගේ නිරීක්‍ෂණ කෙරෙහිය.

---

9. Farmer (1980) පිටු 3
10. Farmer (1978) - ආදර්ශ සමීක්‍ෂණ කීපයක තිබෙන දුර්වලකම් සාකච්චා කරයි.
11. Ryan (1958), Sanderatne (1974)

සැකැස්මක් නැති පරීක්ෂණ ක්‍රමවල බොහෝ අඩුපාඩු තිබේ. ලැබෙන විවිධ පිළිතුරු වල වැදගත් කම අඩු නිසා පර්යේෂකයා ගේ පක්ෂපාතීත්වය, සොයා ගනු ලබන කරුණු වලට වැඩි වැඩියෙන් බලපායි. පිළිතුරු දීමට ඉදිරිපත් වන වඩාත් දොඩමළු අය බෙහෙවින් අවධානයට ලක් වන නිසා ඔවුන්ගේ දොඩමළු බව දැනුම යැයි වරදවා ගනු ලැබේ. විශේෂයෙන් ම මුලින් බලාපොරොත්තු වූ තත්ත්වයන්ට වඩා වෙනස් තත්ත්වයන් ක්ෂේත්‍ර නිරීක්ෂණයන්ගෙන් අනාවරණය වන්නේ නම් එයින් අන්‍යොන්‍ය සම්බන්ධතා නිගමනය කර ගැනීමට නිසිලෙස සකස් කර ගනු ලැබූ ලේඛන ඉවහල් වේ. කෙටියෙන් කියතොත්, ගැඹුරින් පර්යේෂණ කරන්නන් විසින් දැනට උපයෝගී කර ගන්නා සැකැස්මක් රහිත බොහෝ ක්‍රමවලට වඩා බුද්ධිමත්ව ක්‍රියාත්මක කරනු ලබන සමීක්ෂණ විධි මගින් වැඩි දැනුමක් සහ බෙහෙවින් පක්ෂග්‍රාහී නොවුන් විෂය මූලික වූත් තොරතුරු සපයා ගත හැකි වනු ඇත.

(ඉන්දියාවේ) උත්තර් ප්‍රදේශයේ කුඩා ගමක කරන ලද පර්යේෂණයක දී සැකැස්මක් (unstructures) රහිත සුපුරුදු ක්‍රම මුල දී උපයෝගී කරගත් මානව විද්‍යාඥයෙක් වූ ජෝසප් එල්ඩර් (Joseph Elder) සකස් කර ගත් ලේඛන උපයෝගී කර ගැනීමෙන් පසු පිළිතුරු සපයන්නන් ඉබේම තේරී ඉදිරිපත් වීම වළකාලන බවත්,පුළුල් විෂය ප්‍රමාණයක් පිළිබඳ තොරතුරු රැස් කර ගත හැකි බවත්, ඒවා සමාන කළ හැකි බවත්, පසුව වටහා ගත්තේ ය. එල්ඩර් ගේ නිගමනය වූයේ මිනිසුන් සැහෙන විශාල සංඛ්‍යාවක් සමග කටයුතු කරනු ලබන "සමීක්ෂණ ක්‍රම", පාලනය කර ගත හැකි බවත්.... ව්‍යාජ හෝ අහම්බෙන් සිදුවන සබඳතාවන්ට වඩා අව්‍යාජ සබඳතා කෙරෙහි අවධානය යොමු කොට කරුණු පැහැදිලි කර ගැනීම පිණිස පර්යේෂණ මෙහෙයවිය හැකි බවත් ය.[12]

ගැඹුරු අධ්‍යයනයන්ට සම්බන්ධ තවත් ප්‍රශ්ණයක් කෙරෙහි අවධානය යොමු කිරීමට මම කැමැත්තෙමි; එය ඒ අධ්‍යයනයන්ගේ ක්‍රම විධි (Methodology) කෙරෙහි නොව ඒවායේ ස්වාභාවයත්, විෂය පථයත් කෙරෙහි ය. මේ අධ්‍යයනයන්ගෙන් බොහෝමයක් කරන්නට පටන් ගත්තේ ජාත්‍යන්තර විද්‍යාර්ථීන් සමූහයට වැදගත් වන සිද්ධාන්ත පිළිබඳ කුතුහලය පිනවාලීමට හෝ ඒ සිද්ධාන්තයන් පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය දත්ත සම්පාදනය කිරීමට ය; ඒවා ජාතික පර්යේෂණ අවශ්‍යතාවන් අනුව ප්‍රමුඛත්වයක් පාදක කරගෙන නැත. බැලූ බැල්මට, එබඳු පර්යේෂණ සඳහා විදේශාධාර ලැබෙන විට, පර්යේෂණයන්ගේ ජාතික ප්‍රමුඛතා (national priorities) වැදගත් සේ සළකන බවක් නොපෙනේ. එයින් ඇති වන්නේ බැරෑරුම් තත්ත්වයකි. දේශීය සම්පත් ඒ ව්‍යාපෘති සඳහා කෙලින්ම වැය නොවූවත්, ඒ සඳහා දුර්ලභ පුහුණු දේශීය පුද්ගලයන් උපයෝගී කරගනු ලැබේ. මානසික වශයෙනුත් භෞතික වශයෙනුත් පර්යේෂණ ව්‍යායාමය සහ සම්පත් ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් වන අධ්‍යයනයන්ට වඩා උක්ත අධ්‍යයනයන් සඳහා යෙදවේ. පර්යේෂණයෙහි නියුක්ත වූ දේශීය පිරිසට දීමනාවක් ගෙවනු ලබන නමුදු, ඒ ගෙවීම්, දේශීය මිනුම් අනුව ඉතා සතුටුදායක වුව ද ආධාර දෙන රටේ පර්යේෂණ වැය අනුව බලන විට, සුරා කෑමකි. මේ සම්බන්ධයෙන් සඳහන් කළයුතු වැදගත් කරුණ නම්, විදේශ විද්වතුන්ගේ සැලකිල්ලට ලක්වන ගැටළු ගැඹුරින් අධ්‍යයනය කිරිම සඳහා ශ්‍රී ලංකාවෙහි දුර්ලභ බුද්ධිමතුන් ඇදී යාම ය.[13]

12. Elder (1968)
13. Bandaranayake (1976)

ශ්‍රී ලංකාවෙහි අරඹන ලද බොහෝ ගැඹුරු ක්ෂේත්‍ර - අධ්‍යයන වර්තමාන සමාජයට අදාල නොවේ; එයින් සකස් කර ගත යුතු ප්‍රතිපත්තියක් ද නොහැඟේ; අපේ ගොවි සමාජ තේරුම් ගැනීමට ද ඒවා උපකාර නොවේ. ඒ අධ්‍යයන, සමාජීය විද්‍යාවෙහි දැක්වෙන අදහස් සහ සිද්ධාන්ත සනාථ කිරීටම උපකාර වන අති පණ්ඩිත ව්‍යායාම විය හැකිය; නමුත් ඒවායේ නිගමන අප හොඳින් දන්නා දේ හෝ ප්‍රායෝගික වශයෙන් ප්‍රයෝජනවත් නොවන්නක් හෝ විය හැකි යි.

නොයෙක් පර්යේෂණ මධ්‍යස්ථානයන්ට අයත් විද්‍යාර්ථීන්ගේ විශේෂ සැලකිල්ලට ලක් වූ විෂයයන් අරබයා විවිධ ගැඹුරු අධ්‍යයන ඇතිවන නිසා, ඒවා අතර ඇති සම්බන්ධය හෝ සම්බන්ධීකරණය අල්ප විය හැකි ය. ඒ නිසා, ප්‍රමාණවත්ව ප්‍රදේශ අලලා නොතිබීම නිසාද පිරික්සුමට ලක්වූ ක්ෂේත්‍ර එකිනෙකට මිශ්‍ර වීම හෝ ද්විත්ව වීම නිසා ද, ගැඹුරු අධ්‍යයන ගණනකගේ ම අගය අඩු වී තිබේ. අනික් අතින් ඇතැම් අංශ පර්යේෂණයට කොහෙත්ම හසු වී නැත.[14] එබැවින්, අපේ ගොවි සමාජයේ ව්‍යුහය හා විපර්යාස අපට තේරුම් ගැනීමට වැදගත් යැයි සැළකෙන අධ්‍යයනයන්හි නියුක්ත දුර්ලභ පර්යේෂකයන්ගෙන් ප්‍රයෝජන ලබා ගත යුතු අයුරු සැලසුම් කර ගැනීම ඉතාමත්ම වැදගත් ය.[15]

*ක්‍රියාවට නැඹුරු වූ සහභාගිශීලී ගැඹුරු පර්යේෂණ :*

මේ කොටසෙහි මා සාකච්චා කරන්නනට යන්නේ ක්‍රියාවට නැඹුරු වූ සහභාගිශීලී පර්යේෂණ පිළිබඳ ෆාමර්ගේ ලිපියෙහි විමසීමට ලක්වී නැති පර්යේෂණ වර්ගයකි. මෑත දී ඇති වූ ඒ පර්යේෂණ ව්‍යාපෘති මෙතෙක් අත්හද බලා තිබෙන්නේ සීමිත ප්‍රමාණයකට පමණි.[16] පර්යේෂණ - අධ්‍යයන බොහොමයක් උගත් සමූහයකගේ අවධානය උදෙසා කරනු ලැබීමත්, පර්යේෂණයේ පරමාර්ථ උදෙසා ප්‍රයෝජනවත් නොවන බව අවබෝධවීමත්, එකී ව්‍යාපෘතීන් ඇතිවීමට මූල හේතුව වී ඇත. ඇත්ත වශයෙන් බොහෝ පර්යේෂණයන්ගේ ප්‍රතිඵල පර්යේෂණයට භාජනය වූ ගැමියන්ට වත් දන්වනු නොලැබේ. සහභාගිශීලී පර්යේෂණ ක්‍රම විධියේ අභිප්‍රාය වනුයේ "අසම්බන්ධිත වීම සහ විද්වත් උගතුන්ට සීමාවීම යන පාශද්වය බේරීමය."[17]

ඒ අධ්‍යයනයන්ගේ මූලික ලක්ෂණ නම්. පර්යේෂකයන් ගම තුළ වෙසෙමින් පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා සාධක රැස් කිරීම හා ගැටළු විස්තර කිරීමට වඩා ගැමියන්ගේ ප්‍රශ්ණ තේරුම් ගැනීමට උත්සාහ කර ඒ ප්‍රශ්ණ නිරාකරණය කර ගැනීම සඳහා ඔවුන්ට විසඳුම් සොයා දීමයි. පර්යේෂකයන් විසින් විෂය වූ අවස්ථාව පිරික්සමින්, ගැටළු හඳුනා ගනිමින්, අවශ්‍යතා නිශ්චය කර ගනිමින්, හැකියාවන් පිළිබඳ තාක්ෂණික දත්ත ලබා ගනිමින්, සහ ගැමියන් සමග නිරතුරුව සාකච්ඡා කරමින් කල් යෑමේ දී විසඳුම් හෝ ක්‍රියාත්මක කළහැකි වැඩ සටහන් වර්ධනය කරගනු ලැබේ.

ඒ අධ්‍යයනයන්ගේ උපාංග වනුයේ, ගැටළු වල ප්‍රමාණය වටහා ගැනීම, තිබෙන

14. Peiris (1978) පිටු 59 සහ පිටු 55-56
15. මේ කරුණ ලිපියෙහි අවසාන කොටසෙහි සාකච්ඡා කෙරේ.
16. සර්වෝදය විසින් කර තිබෙන ගම් පිළිබඳ අධ්‍යයන, ගොවි සම්මේලන ව්‍යාපෘති, සමුපකාර සහ සුළු ගොවි සංවිධාන පිළිබඳව ICA/RTI/NCC/CLT සංවිධාන වල කරන පර්යේෂණ ව්‍යාපෘති
17. Verhagen (1979) පිටු 4.

සම්පත් තක්සේරු කර ගැනීම, සහ ක්‍රියාත්මක වැඩ සටහනක් දියත් කිරීම පිණිස පිළිගනු ලැබූ ආයතනික රාමුවය.

සාම්ප්‍රදායික විෂය අධ්‍යයනයන්ට වඩා ඒ අධ්‍යයන, එක් අතකින්, ඉතා අධික ගැඹුරු බවකින් යුක්ත ය. තොරතුරු එක් රැස් කරමින් ක්‍රියාත්මක වැඩ සටහනක පිළියෙළ කර ගන්නා ක්‍රියාවලියෙහි දී "විෂය බද්ධ" (objective) පර්යේෂකයන් ගොවීන් සමග සහභාගී වන්නන් වන අතර, ගොවීහු පර්යේෂණයෙහි "සහභාගීවන්නන්" වන්නාහ. මේ අන්‍යොන්‍ය බලපැවැත්ම, සාම්ප්‍රදායික හුදු පර්යේෂණ ව්‍යාපෘතියකට වඩා හොඳින් ගොවි සමාජයක කටයුතු කෙරෙන අයුරු අවබෝධ කර ගැනීමට උපකාර වෙති යි සිතේ.

එහෙත්, මේ පර්යේෂණය ආශ්‍රිත නොයෙක් අඩුපාඩු සහ ගැටළු ඇත. මේ පර්යේෂණ වෘත්තීන්හි ද, ආරම්භක ප්‍රවේශය පිටස්තරයෙකුගේ මෙන් වන අතර පර්යේෂකයන්ගේ "ශාස්ත්‍රීය දයාදය" පෙර පුහුණුව සහ අත්දැකීම් - හේතු කොට ගෙන සාම්ප්‍රදායික ක්‍රමයට තොරතුරු එක් රැස්කිරීමට ඔවුහු නැඹුරු වෙති. එකතු කර ගනු ලබන තොරතුරු වලින් සහ ඒ මගින් වර්ධනය කර ගනු ලබන ක්‍රියාත්මක වැඩ සටහනෙන් ද අපේක්ෂා කෙරෙන්නේ කුඩා ව්‍යාපෘති සකස් කර ගැනීමය: සැම තැනටම ගැලපෙන ඒවා නොවේ. එබැවින් සැම ගමක් සඳහා කුඩා ව්‍යාපෘති සකස් කර ගැනීමේ අදහසින් එවැනි අධ්‍යයන කරනු ලැබුවහොත්, ඒ අධ්‍යයන කිරීමට කැප වූ පුද්ගලන් ප්‍රමාණවත් ව සොයා ගත නොහැකි වනු පමණක් නොව විශාල වියදමක් ද දැරීමට සිදුවනු ඇත. පර්යේෂණයෙන් පසුව (බොහෝවිට විදේශ ආධාරය ඇතිව) වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබති'යි යන විවෘත ප්‍රකාශය අනුව පර්යේෂණය පටන් ගන්නා හෙයින් ඒ අපේක්ෂාවම, විෂයික අවස්ථාව තක්සේරු කිරීමේ දී ඇතැම් අංශ කෙරෙහි පමණක් අවධානය යොමු කරවිය හැකිය; තව ද, පොරොන්දු වූ ක්‍රියාත්මක වැඩ සටහන ඉක්මණින් දියත් නොකරනු ලැබුවහොත් සහභාගි වූවන් ඉතා බරපතල කලකිරීමකට පාත්‍ර විය හැකි ය.

ක්‍රියාවට නැඹුරු වූ මේ සහභාගිශීලී පර්යේෂණ ව්‍යාපෘතීන් යථෝක්ත සීමාවන් තිබුණ ද, කිසියම් ප්‍රදේශයක තිබෙන ගොවි ප්‍රශ්ණ විසඳාලීමේ අටියෙන් තේරුම් ගැනීම පැසසිය යුත්තකි.එහෙත්, ඒ අධ්‍යයනයන්ගේ ප්‍රබලත්වයන්, යෝග්‍යත්වයන් සීමිත වන බැවින්, පර්යේෂණ වියදම් අඩුකරගෙන එවැනි අධ්‍යයන විශාල ප්‍රමාණයක් කිරීමට අනුබල දෙන ක්‍රමයක් සකස් කර නොගතහොත් ඒ අධ්‍යයන යන්ගේ බලපෑම සීමිත එකක් වනු ඇත. එය සාර්ථක කර ගත හැකි එක් ක්‍රමයකි, ගැමියන්ට පර්යේෂණ ක්‍රමවිධි පිළිබඳ දැනුම ලබා දී පර්යේෂණ සඳහා ඔවුන් යොදවා ගැනීම. මේ ක්‍රමයෙන් පෞද්ගලික ලැදියාවන් ඇතුල්වීමට ඉඩ ඇති නමුදු ඔවුන්ගේ තත්ත්වය පිළිබඳව ඔවුන් ලබා ගන්නා කිට්ටු දැනුම ඔවුන්ගේ ප්‍රශ්ණ වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට ඉවහල් වන්නේ ය.

අද ගොවිකටයුතු පර්යේෂණ නිතරම කරනු ලබන්නේ පිටස්තරයන්, උගත් නාගරික විද්‍යාර්ථීන් ද, බොහෝ විට විදේශිකයන් හා විදේශීය විශේෂඥයන් ද විසිනි. පර්යේෂණ කටයුතුවල ගොවීන්ටත් යෙදිය හැකි යන අදහස ඒ පිටස්තරයන්ට ඒත්තු ගැන්වීම දුෂ්කර වනු ඇත. එසේ වුවත්, ගොවි පර්යේෂණයන්හි එම සංකල්පය විමර්ශනයට භාජනය කර අනාගතයේ දී අත්හද බැලීම සුදුසු යයි මම යෝජනා කරමි. එවැනි පර්යේෂණ සඳහා නව ක්‍රම විධි වර්ධනය කර ගැනීම ඒ පර්යේෂකයන්ගේ ශක්‍යතාවට අත්‍යාවශ්‍ය වන්නේ ය.

*සාරාංශය සහ අවසාන නිරීක්ෂණ*

මේ ලිපියෙන් උත්සාහ කර තිබෙන්නේ, කරනු ලබන නොයෙක් විධියේ ක්ෂේත්‍ර - වැඩ, ගොවිකටයුතු ප්‍රතිපත්ති සහ ගොවි කටයුතු අධ්‍යයන සඳහා අවශ්‍ය ගොවි තොරතුරු එකතු කිරීම අරමුණක් ඇති රාමුවක් ඇතුලත තැබීම ය. ක්ෂේත්‍රයට යෑම පිළිබඳ ෆාමර් විසින් සරදම් ස්වරයකින් කර තිබෙන විග්‍රහය පිළිගන්නා ලද නමුදු ක්ෂේත්‍ර සමීක්ෂණ, ක්ෂේත්‍ර වැඩ නොවෙතියි යන ඔහුගේ මතය අපි බැහැර කළෙමු. ඒ වෙනුවට, ප්‍රතිපත්ති තීරණ සහ ජාතික ප්‍රශ්ණ අවධාරණය කර තිබෙන අතර එවැනි ක්ෂේත්‍ර - වැඩ සැලසුම් කිරීමෙහි දීත් ක්‍රියාත්මක කිරීමෙහි දීත් හමුවන ඇතැම් දුෂ්කරතා පෙන්වා දෙනු ලැබීය.

ගැඹුරු විෂය - අධ්‍යයනයන්ගෙන් ප්‍රයෝජනවත් අවබෝධයක් සැපයෙන නමුදු, රටේ ප්‍රශ්නයන්ගේ ප්‍රමාණය හෝ සාමාන්‍ය ස්වභාවය තක්සේරු කිරීමේ දී එහි අගය සීමිත. වේ. අවාසනාවට, විශේෂ පෙදෙස්වල විෂය අධ්‍යයනයෙහි නියැලුනු පර්යේෂකයෝ, ස්වකීය විශේෂ අත්දැකීම අනුව සාධාරණීකරණයට නැඹුරු වන අතර, ඇතැම් විට තාමාත්‍රාවෙහි පිහිටා ප්‍රතිපත්ති තීරණයට බලපාති. ඔවුන්ට කැලෑව නොපෙනේ; පෙනෙන්නේ ගස් පමණි. ක්‍රියාවට නැඹුරු වූ ගැඹුරු පර්යේෂණ අධ්‍යයන පිළිබඳ සටහනක් මේ ලිපියෙහි ඇතුළත් විය. මේ අධ්‍යයන ව්‍යාපෘති ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත කළ නොහැකි වීම නිසා, ඒවායේ ප්‍රයෝජනත්වය ද සීමාසහිත ය.

යථෝක්ත සීමාවන් නිසා, සමාජ චර්යා සහ සමාජ ලක්ෂණ තේරුම් ගැනීමේ දී ඒ ගැඹුරු අධ්‍යයනයන්ගේ ඉමහත් අගය අවම කළ යුතු නොවේ. සමාජීය විද්‍යාඥයාට ඒ අධ්‍යයනයන් ස්වාභාවික විද්‍යාව හෝ ශුද්ධ විද්‍යාව පිළිබඳ විශේෂඥයෙකු විසින් රසායනාගාරයක් තුළ කරනු ලබන සීමිත අත්හද බැලීම් වලට බෙහෙවින් සමාන ය. සමාජ සාධකයන්ගේ සම්පූර්ණ පරිමාණය ක්ෂේත්‍ර - සමීක්ෂණ මගින් තක්සේරු කරනු ලැබීම නිසා, ඒ සාධක පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඒ අධ්‍යයන පාදක වේ.

මේ කරුණ කල්පිත නිදර්ශනයකින් පහද දීමට කැමැත්තෙමි. පහත සඳහන් ගැඹුරු අධ්‍යයන අට පටන් ගෙන ඇතැයි සිතමු.

- උඩරට ගමක ඉඩම් භුක්ති ක්‍රමය,
- සබරගමුවේ කුඩා ගමක කෘෂි නිෂ්පාදන අලෙවිය.
- යාපනයෙහි ගම් දෙකක කෘෂිකාර්මික කටයුතු වලට කාන්තාවන් ගේ සහභාගිත්වය පිළිබඳ අධ්‍යයනයක්,
- වවුනියාවේ කෘෂිකර්ම සංවිධානයට නල ළිංවල බලපෑම,
- ගාලු දිස්ත්‍රික්කයෙහි ගම් තුනක කුලය සහ ඉඩම් බුක්ති අතර සබඳතාව,
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම් දෙකක නව කෘෂිකාර්මික තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා සමාජීය සහ ආර්ථික සාධකයන්ගේ බලපෑම,
- පොලොන්නරුවේ පුරාණ ගම්වල මී හරකුන් වෙනුවට ට්‍රැක්ටර් ආදේශ කිරීම,
- පහත රට තෙත් කලාපීය ගමක පශු පාලනය කෙරෙහි කුලයේ ආගමේත් බලපෑම,

ගොවිජන ආර්ථිකයේ සහ සමාජයේ විවිධ අංශ අරබයා වන මේ ගැඹුරු අධ්‍යයන අටේ (8) අගය ඇත්තෙන්ම; සීමා වී තිබෙන්නේ සීමිත භූ ප්‍රදේශයක පවත්නා විශේෂ තත්ත්වයන් තේරුම් ගැනීමට ය. ඒ විශේෂ පෙදෙස් වල ඇති ප්‍රශ්ණ විසඳ ලීමට යම් පියවරක් ගනු ලබන්නේ නම් මේ අධ්‍යයන ප්‍රයෝජනවත් වේ. එසේ නොවුවහොත් එයින් ලබන අවබෝධයන් සීමිත විය හැකි ය. ඉහත සඳහන් කල්පිත ගැඹුරු විශේෂ අධ්‍යයන අටෙන් සැපයෙන දත්ත උපකාර වනුයේ යම් සිද්ධාන්තයක් හෝ ආදර්ශයක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමටය. එවිට විද්‍යාර්තිකයෙකුගේ පිළිගැනීම තහවුරු කෙරෙන නවත් ප්‍රකාශනයක් පළ කරනු ලැබේ.

අතික් අතින්, නිදසුනක් වශයෙන්, තෝරා ගනු ලැබූ පෙදෙස් වල නව කෘෂිකාර්මික තාක්ෂණය උපයෝගී කර ගැනීමට බලපාන සමාජ සහ ආර්ථික සාධක පිළිබඳව ගැඹුරු විෂය අධ්‍යයන අටක් කරනු ලැබුයේ නම්. ඒ අට අතර ඇති වෙනස්කම් තුලනාත්මක විශ්ලේෂණයකට ලක් කිරීමටත් ප්‍රශ්නයේ ගැඹුරු පැති තේරුම් ගැනීමට උපකාර වන ප්‍රයෝජනවත් අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත

මා පවසා ඇති අදහස් වලින් හැඟෙන්නේ ගැඹුරු පර්යේෂණ අධ්‍යයන පාලනය කිරීමට මා පක්ෂ බවකි'යි නොසිතිය යුතු ය. ඇත්තෙන්ම එවැනි අදහසක් මා තුළ නැත. පහතරට කාන්තාවන්ගේ දොළදුක්, කෙරෙහි කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගේ මිළ බලපාන අයුරු පිළිබඳ පර්යේෂණයෙන් රටට ප්‍රයෝජනයක් සිදු නොවෙතියි අප කල්පනා කල ද, ඔහු ඒ සඳහා පෞද්ගලික සම්පත් උපයෝගී කරගන්නේ නම්, ඔහුගේ මනදොළ සංසිඳවා ගැනීමට ඉඩ දිය යුතු ය.

එහෙත් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වැනි පර්යේෂණ ආයතන සහ විශ්වවිද්‍යාල විසින්, ගැඹුරු විෂය අධ්‍යයන ඇතුලත් කර ගත හැකි වන පරිදි සම්පූර්ණ පර්යේෂණ සැලැස්මක් සකස් කර ගත යුතු ය. දැනට, ගැඹුරු විෂය අධ්‍යයන හෝ ක්ෂේත්‍ර සමීක්ෂණ අතර තිබෙන සම්බන්ධීකරණ ඉතාම අල්ප ය. එහි ප්‍රතිඵලය වනුයේ ශ්‍රී ලංකාවෙහි ගොවි කටයුතු විපර්යාසයන්ට සම්බන්ධ ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීමට එකතු කර ගනු ලබන දත්ත ප්‍රමාණවත් නොවීමය; එපමණක් නොව පිරික්සීමට ලක්විය යුතු ඉතාමත් වැදගත් ක්ෂේත්‍ර බොහොමයක් පර්යේෂණයට පාත්‍ර වී නැත.

බාධක රහිත පර්යේෂණයන්හි යෙදීමට නිදහස තිබිය යුතු ය. පර්යේෂණයක ප්‍රතිඵල වාර්තා කළ නොහැකි නම්, තොරතුරු රැස් කිරීමේදී කොතරම් හොඳ පර්යේෂණ ක්‍රම අනුගමනයකළ ද ඉන් ප්‍රයෝජනයක් අත් වන්නේ නැත. අවාසනාවට පසුගිය කාලවල ගොවි කටයුතු අධ්‍යයනයෙහි දී ඇතැම් ක්ෂේත්‍ර - වැඩ වලින් සොයා ගන්නා ලද කරුණු සම්පූර්ණයෙන් වෙනස් කරනු ලැබූ හෝ වාර්තා කිරීමට ඉඩ නොදුන් අවස්ථා ඇත.[18]

පර්යේෂණ අධ්‍යයනයකින් බලාපොරොත්තු වන්නේ කලින් නිශ්චය කර ගත් නිගමණයන්ට එළඹීම නම්; ඒ පර්යේෂණ සඳහා වැය කළ මුදල විශාල නාස්තියක් වනු පමණක් නොව නොමග යවන්නක් ද වන්නේ ය. පවත්නා දේශපාලනික සහ රාජ්‍ය රාමුව අනුව පර්යේෂණයකින් අනාවරණය වන ඇතැම් තොරතුරු ප්‍රකාශයට පත්කළ නොහැකි

18. Peiris (1978) පිටු 56

නම්, බලයෙහි සිටින අය සතුටු වන පරිදි ඒ තොරතුරු වෙනස් කරනු වෙනුවට සොයාගත් ඒ තොරතුරු, සීමිත සංඛ්‍යාවක් අතරට ලැබෙන්නට සැලැස්වීම වඩාත් මැනවි.

මේ ලිපියෙන්, ගොවිකටයුතු සම්බන්ධ ක්ෂේත්‍රයන්හි සහ පර්යේෂණයන්හි තිබෙන නොයෙක් ප්‍රශ්ණ පිළිබඳ තවදුරටත් කල්පනාව යොමු වීමට සහ විවාද කිරීමට පෙළඹවීමක් සිදු වුවහොත්, බලාපොරොත්තු වූ පරමාර්ථ ඉටු වී තිබේ. මීළඟට පළවන ගොවිකටයුතු අධ්‍යයන පිළිබඳ ශ්‍රී ලංකා සඟරාවේ කලාපයන්හි පර්යේෂණ අධ්‍යයනයන්ගේ ක්‍රම - විධි පිළිබඳ විමර්ශණ සහ සංවාද සඳහා මාධ්‍යයක්වනු ඇතැයි අපේක්ෂා කරමි.

*ආශ්‍රිත නිබන්ධ*


Bandaranayake, S. (1976) : "The National Organisation and Control of Academic and Scientific Resources in Third World Countries", paper presented at the Sri Lanka Association for the Advancement of Science, Special International Sessions - 1976 on Scientific and Technological Co-operation Among the Non-Aligned Countries.

Shanti, U.N. (1975) : "Improving the Accuracy in Economic Survey" in Tan Bock Thism and Shao Er Ong (Ed.) **Readings in Asian Farm Management,** Singapore University Press.

Elder, Joseph W. (1968) : "Using Survey Research Methods in Traditional Societies" in Milton Singer and benard Cohn (Ed.), **Structure and Change in Indian Society** Aldine, Chicago. Reprinted in **ADC Traching forum.**

Farmer, B.H. (1980) : "Some thougts on the Place of Field Work in Agrarian Studies", **Sri Lanka Journal of Agraian Studies.** vol. 1 No. 1 pp. 1-11

Nair, Kusum (1961) : **Blossoms in the Dust - The Human Element in Indian Development,** Allied Publishers, New Delhi.

Peiris, G.H. (1978) : "Reflections on Agrarian Reserach in Sri Lanka in the 1970's", **The Ceylon Journal of Historical and Social Studies,** Vol. VI (New Series) No. 2 pp. 48-68.

Ryan, Brycs (1950) : "The Historical Evolution of Sri Lanka's Land Tenure Regions" Chapter 11, **The Politicial Economy of Asian Agrarian Reform** pp. 263-280, Ph.D. Thesis, University of Wisconsin.

Verhagen, Loenraad (1979) : Discussion Paper on Research Methodology and Orientation, Working Document No. 3 for ICA/RTI/NCC/ CLT Research Farmer Development . (Mimeo)